# මහායාන ආගමේ ව්‍යාප්තිය හා සාධක පිළිබඳ පුරාවිද්‍යාත්මක විමසුමක් (අනුරාධපුර අභයගිරිය විහාරය ඇසුරින්)

**ඩී.එම්.ඩී.සී. දිසානායක**
අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය.
dmdcdeepika@gmail.com

ප්‍රමුඛපද : අභයගිරිය, ආගම, කැනීම්, මහායානය, පුරාවිද්‍යාත්මක

## හැඳින්වීම

ථෙරවාදී බුදුදහම පිළිගත් බෞද්ධයන් අතරට මහායාන ආගම මුල්බැස ගත්තේ අභයගිරිය කේන්ද්‍රකර ගෙන බැව් බොහෝ දෙනෙකුගේ පිළිගැනීම වේ. මේ සම්බන්ධ ව නොයෙකුත් මූලාශ්‍ර තිබුණත් ඒ අතරින් වඩා වැදගත් සාක්ෂි සපයනු ලබන්නේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් බැව් පිළිගත හැකි ය. අභයගිරිය කේන්ද්‍රකර ගනිමින් සිදු කළ පුරාවිද්‍යාත්මක පර්යේෂණ මඟින් ඉතිහාසයෙන් වැළලී ගිය මහායාන සාධක මතුකර ගැනීමට හැකි වී ඇත. එකී සාදක ඔස්සේ අභයගිරියේ මහායාන ආගම ව්‍යාප්ත ව පැවතියේ ද යන්න අධ්‍යයනයක් මෙම පර්යේෂණය හරහා සිදුකර ඇත. මෙම අධ්‍යයනය සිදුකිරීමේ ප්‍රධාන අරමුණ වූයේ අභයගිරියේ පුරාවිද්‍යා සාධක අතර ඇති මහායාන සාධක හඳුනා ගැනීම වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී අධ්‍යයන ක්‍රමවේද කිහිපයක් භාවිත කෙරිණි. මූලාශ්‍ර පරිශීලනය ඔස්සේ අධ්‍යයනයට අවශ්‍ය මූලික දත්ත සපයාගත් අතර ක්ෂේත්‍ර ගවේෂණය හා ඡායාරූප ගැනීම තුළින් දත්ත එක්රැස් කිරීම සිදුකරන ලදී. එක් රැස්කරගත් දත්ත විශ්ලේෂණයට බඳුන් කර මෙම අධ්‍යයනය ඔස්සේ තොරතුරු ඉදිරිපත් කරනු ලැබිණි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයෙන් පසු ව ඇරඹි අනුරපුරයේ මහාවිහාරයෙන් පසු ව ශාසන ඉතිහාසයට එක් වූ විහාරයන් ගණනාවකි. ඒ අතරින් වට්ටගාමිණී අභය රජු විසින් කරවන ලද අභයගිරි විහාරය, අභයුත්තර මහාථූප, උත්තරාරාමය, උත්තර විහාර ආදී නම්වලින් හඳුන්වනු ලබන අභයගිරි විහාරය ලාංකික බෞද්ධ ඉතිහාසයේ ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. මහා විහාරයෙන් පසු ව ස්ථාපිත වූ මෙම විහාරයේ භික්ෂූන් 5,000 පමණකගේ විශ්වවිද්‍යාලයක් වූවා පමණක් නොව මහා විහාරයේ පළමු ප්‍රතිවාදියා වූයේ ද මෙයයි. මහාවිහාර භික්ෂූන් හා අභයගිරි විහාර භික්ෂූන් අතර නොයෙක් ආකාරයේ ආගමික සට්ටනයන් හටගෙන ඇත. මේ

අතරින් ප්‍රමුඛ සට්ටනය වන්නේ මහාවිහාර භික්ෂූන් ථෙරවාද බුදුදහම අනුගමනය කරද්දී අභයගිරි භික්ෂූන් මහායාන අදහස් වැළඳ ගැනීමයි. අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට ම ථෙරවාද බුදුදහම ලක්දිව පිළිගත් දහම බවටපත් වී තිබුණත් වරින්වරට මහායාන බුදුදහම ලක්දිව පැනනැගුණු බවට වංසකතා සාක්ෂි දරනු ලබයි.

ක්‍රිස්තු වර්ෂ පස්වන ශතවර්ෂය දක්වා වූ දීර්ඝ කාලය තුළ මෙරට සංස්කෘතිය හා සමාජය සතු සෑම විෂයක්ෂේත්‍රයකට ම මහායානය බල පැවැත් වීය. ථෙරවාද බුදුදහමේ පාලි භාෂාව ප්‍රමුඛවූවා සේ ම හායාන ධර්මයේ ප්‍රමුඛ වූයේ සංස්කෘත භාෂාවයි. මේ නිසා අභයගිරිය, ජේතවනය, දක්ෂිණගිරි විහාරය, විජයාරාමය ආදී ස්ථාන සංස්කෘත භාෂාව කර ගත් භික්ෂූන්ගේ බලකොටු බවට ක්‍රමයෙන් පෙරළිණි (සාසනරතන, 370).

මේ ආකාරයට ඇරඹී මහායාන ආගම අනුරාධපුරයේ ව්‍යාප්ත ව පැවති බවට සාහිත්‍ය හා වංසකතා මූලාශ්‍රවලට අමතර ව පුරාවිද්‍යාත්මක කැනීම් ඔස්සේ අනාවරණය කරගෙන ඇති සාධකවලින් ද ඔප්පු වී ඇත. ඊට අමතර ව ශිලාලේඛන ඔස්සේ ද සාක්ෂි හමු වී ඇත. අනුරාධපුර ජේතවන භූමියෙන් හමු වූ මහසෙන් රාජ්‍ය කාලයට අයත් ලිපියක "වයතුඩලක" යනුවෙන් වෛතුල්‍යවාදය ගැන සඳහන් කර ඇත. එහි වෛතුල්‍ය පොත් අභයගිරියේ තැන්පත් කළ බවට අදහසක් මතුකර ගැනීමට හැකි වී ඇත (කුලතුංග,289).

අභයගිරි ස්තූපය ආසන්නයේ ඇති ධාරණී ගෘහය මහායාන ආගමේ ව්‍යාප්තිය පිළිබඳ වැදගත් සාක්ෂි සපයනු ලබයි. ථෙරවාදී බුදුදහමේ පිරිත හා සමාන ව මහායානයේ ධාරණී දක්නට ඇත. මෙම ධාරණී මහායානිකයින් සිතන පරිදි බුදුන්වහන්සේ විසින් ම බෝධිසත්වයන්ට වදාරණ ලද ඒවා ය (එම, 167). මේ අනුව පෙනීයන්නේ අභයගිරියේ භික්ෂූණ්ට ධාරණ සූත්‍ර දේශනා කිරීම සඳහා වෙන ම ගෘහයක් ඉදිකර ඇති බවයි. එම ගෘහය ආශ්‍රිත ව තිබී 1939 දී සෙනරත් පරණවිතාන නාගරී අක්ෂරයන්ගෙන් ලියූ ධාරණ ගල් අටක් සොයා ගෙන ඇති අතර අභයගිරි මධ්‍යම සංස්කෘතික අරමුදල සිදු කළ කැනීම් මගින් තවත් ධාරණ ගල් දෙකක් සොයාගෙන ඇත.

2011 වර්ෂයේ අභයගිරි ස්තූප සංරක්ෂණය කරන අවස්ථාවේ දී ගර්භයේ තැන තැන නිදන් කර තිබූ මහායාන පුරාවස්තු හමු වී ඇත. ඒ අතරින් ගල් පුවරුවක කොටන ලද ධාරණ මන්ත්‍රයක් ද හමු වී ඇත. තව ද සුදස්සන පධානඝරයේ කැනීමෙන් නාගරී අක්ෂර සහිත මහායාන ධාරණයක කොටසක් හමු වී ඇත.

අභයගිරි ස්තූපයේ දකුණු දෙරටුව අසළ ඇති අභිෂේක මණ්ඩපය ද මහායාන ආගම අභයගිරියේ ප්‍රචලිත ව පැවති බවට තවත් සාක්ෂියකි. මහායාන ආගමේ භික්ෂු අභිෂේකයක්

ගැන සඳහන් වන බවත් එම අභිෂේකය සිදු කළ ස්ථානය මෙය විය හැකි බවත් ටී. ජී. කුලතුංගයන් පුරාණ අභයගිරිය ග්‍රන්ථයේ සඳහන් කරනු ලබයි. ඒ අනුව මහායාන සාධකයන් අතර එම සාක්ෂිය ද සැලකිය හැකි ය.

අභයගිරියට අයත් සෙසු ආරාමයන්හි පවතින කැටයම් මඟින් ද මහායානය පිළිබඳ සාක්ෂි සපයා ගත හැකි ය. ඊට සුදුසු ම නිදර්ශනය වන්නේ විජයාරාම පබ්බතාරාමයට අයත් සභා ශාලාවේ ඇති කැටයම් තුළ තාරා දෙවඟන හා අවලෝකිතේශ්වර බෝසතුන් කැටයම්කර තිබීමයි. අභයගිරිය ව්‍යාපෘතිය මඟින් විජයාරාම ශුද්ධ චතුරස්‍ර දෙරටුව අළලා සිදුකරන ලද කැනීම්වල දී සංස්කෘත අක්ෂර සහිත තඹ පත්ඉරු පහක් හමු වී ඇත. ඒවායෙහි සඳහන් වන්නේ මහායාන සූත්‍ර බැව් හඳුනාගෙන ඇත. එහි එක් තඹ ඉරුවක ලිය වී ඇති පාඨයක් නම් "ඕම් තරෙතු තරෙතු රෙස්වාහ:" යනුවෙනි. මහායාන සූත්‍ර බොහොමයක "ඕම්" යන්න සඳහන් වන නිසාත් මහායාන ආගමේ ප්‍රධාන භාෂාව සංස්කෘත වන නිසාත් මේවා මහායාන ආගම පිළිබිඹු කරන සාධකයක් බව නිගමනය කළ හැකි ය.

අභයගිරි කෞතුකාගාරයේ දැනට ප්‍රදර්ශනය කර ඇති කෞතුක වස්තු අතර මහායාන සාධකයන් කිහිපයක් දක්නට ලැබේ. ඒවා අතර මහායාන කැටයම් ඵලකය, අවලෝකිතේශ්වර බෝසත් ප්‍රතිමාව, තාරා දෙවඟනගේ සම්පූර්ණ ප්‍රතිමාවක් හා හිස සුන් ප්‍රතිමාවක් ද, වජ්‍රයක් හා ධාරණී පුවරුවක් දකගත හැකි ය. මේ කෞතුක වස්තු සියල්ල ම හමු වී ඇත්තේ අභයගිරි පුරාවිද්‍යා ක්ෂේත්‍රය අළලා සිදු කළ කැනීම් මගිනි. මේවා අතරින් අභයගිරිය ස්තූප ගර්භයේ නිදන් කර තිබිය දී මතුකර ගත් මහායාන කැටයම් ඵලකය විශිෂ්ට නිර්මාණයක් ලෙස සැලකිය හැකි ය. මෙහි බෝධිසත්ත්වයන් තිදෙනෙක් නිරූපණය කර ඇති බැව් ටී.ජී. කුලතුංග අදහස් දක්වා ඇත. මෙය දුටු පමණින් හැඟීයන්නේ ගෞතම බුදුන්වහන්සේ ධර්මය දේශනා කරන ආකාරයකි. මෙහි මධ්‍යයේ සිටින්නේ අමිතාභ බුදුන්වහන්සේ බවත් වම්පසින් හා දකුණුපසින් අවලෝකිතේශ්වර හා මහාස්ථාම ප්‍රාප්ත බෝධිසත්වයන් බව හඳුනාගෙන ඇත. උසින් අඟල් 10.7 හා පළලින් අගල් 8.9ක් වූ මෙම ඵලකය මථුරා කලාශිල්ප සම්ප්‍රදායට අයත් භාරතීය නිර්මාණයකි (එම, 307).

ලෝකඩ අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් ද තාරා දෙවඟනගේ හිසසුන් ප්‍රතිමාවක් ද මෙම ප්‍රදර්ශන භාණ්ඩ අතර වේ. පෙරුම්දම් පුරමින් බුදුබව ප්‍රාර්ථනා කරන උතුමන් වහන්සේලා බෝධිසත්ත්වයන් නමින් හැඳින් වේ. මහායාන බෝධිසත්ත්වයන් අතරින් අවලෝකිතේශ්වර බෝසතුන් බොහෝ දෙනාගේ බුහුමනට ලක්වන බෝධිසත්ත්ව වරයෙකි. අභයගිරියේ ද වැඩි වශයෙන් හමු ව ඇත්තේ අවලෝකිතේශ්වර බෝසතුන්ගේ පිළිම බැව් හඳුනාගත හැකි ය.

අවලෝකිතේශ්වර බෝසතුන්ගේ ශක්ති රූපය ලෙස සැලකෙන්නේ තාරා දෙවඟනයි. ඇයගේ ප්‍රතිමා දෙකක් මෙම පුරාවිද්‍යා භූමියෙන් හමු ව කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. මහායාන බුදුදහමේ ප්‍රබල නිර්මාණයක් ලෙස වජ්‍රය සළකනු ලබයි. පුරාවිද්‍යා කැනීම් මගින් හමු වූ වජ්‍රයක් ද කෞතුකාගාරයේ දැකගත හැකි ය.

අභයගිරියේ මහායාන ආගම පැවති බවට ප්‍රබල සාධකයන් වැළලි ගිය නටඹුන් අතර තිබුණු බවට පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ මේ ආකාරයට මතු කරගෙන ඇත. ඒ සෑම සාධකයකින් ම කියාපාන්නේ මහායාන ආගම අභයගිරිය කේන්ද්‍ර කරගෙන පවතින්නට ඇති බවත් එහි සාධකයන් තවමත් ශේෂ ව පවතින බවත් ය.

### ආශ්‍රිත ග්‍රන්ථ


සාසනරතන හිමි, මොරටුවේ, (2012) ලක්දිව මහායාන අදහස්, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

කුලතුංග, ටී.ජී. (2014) පුරාණ අභයගිරි විහාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, (2015) මහාවංසය සිංහල, දෙහිවල.